# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
# 2023.05.19

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023.05.19 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදි.

2009.05.18 වන දින අන්තවාදී ත්‍රස්ත කණ්ඩායම් පරාජය කරමින් දෙතිස් වසරක් පුරා පැවති යුද්ධය නිමාවට පත්වීම හා ඒ වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කැපවූ රණවිරුවන් සිහිකිරීම සඳහා සියලුම දෙනා විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදි.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අරමුණ පැහැදිලි කරමින් අද දින රැස්වීමේ දී විවිධ ක්ෂේත්‍ර යටතේ සාකච්ඡා කිරීමට බොහෝ කරුණු ඇති බව පෙන්වා දෙමින් ගරු සභාපතිතුමන්ලා වෙත රැස්වීමේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදි.

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් වාර්තා නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **පසුගිය රැස්වීමෙන් පැන නැගුණු කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම** | | | |
| 1.1 | තරුණසේවා සභාව සතු ඉඩකඩම් හා ගොඩනැගිලි භාවිතය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීම | යායවත්ත දිස්ත්‍රික් කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානයේ භූමි ප්‍රමාණය පර්චස් 40ක් බවත්, එහි ගොඩනැගිලි 03ක් පිහිටා ඇති බවත් එම ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන පන්ති කාමර තුල පූර්ණ කාලීන පාඨමාලා වශයෙන් පරිගනක, රූපලාවන්‍ය, පෙරපාසල් ගුරු හා වෘත්තීය ඉංග්‍රීසි යන පාඨමාලා පවත්වාගෙන යන බවත්, අර්ධකාලීන පාඨමාලා ලෙස ඉංග්‍රීසි, පරිගනක යෙදවුම් සහායක හා ජපන් භාෂා පාඨමාලා පවත්වාගෙන යන බවත් දන්වන ලදි.<br>එරම්ණියාය ගොවිපල හා ස්විස් පුහුණු මධ්‍යස්ථානයේ භූමි ප්‍රමාණය අක්කර 80ක් වන බවත්, එම භූමියේ අක්කර 9ක කුඹුරුද, අක්කර 6ක පොල් ද, අක්කර 5ක ගස් කජු ද අක්කර 2ක අඹද වගාකර ඇති අතර අක්කර 2ක වැවැ පිහිටා ඇති බවද දන්වන ලදි. ඉතිරි බිම් ප්‍රමාණය සත්ව පාලන කටයුතු හා වගා කටයුතු සඳහා වෙන් කර ඇති අතර එහි අක්කරයක දෙමුහුන් මිරිස් වගාවක් ද, අක්කරයක තක්කාලි වගාවක් ද, අක්කරයක මඤ්ඤොක්කාද, තවත් අක්කරයක වැල්දොඩම් වගාවක්ද ඇති අතර අක්කර 4ක නව කුඹුර සකස් කිරීම සිදුවන බව ද දන්වන ලදි. | මෙම සම්පත් ඉහල ඵලදායීතාවයකින් යුතුව පරිහරණය කළ යුතු බව දන්වන ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වී යන්ත්‍රෝපකරණ හා වාහන අලුත්වැඩියා කරගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - ජාතික තරුණ සේවා සභාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තවද එම භූමියෙහි ප්‍රාථමික කර්මාන්ත ශාලාව, සේවා කර්මාන්ත ශාලාව, කාර්යාල ගොඩනැගිලි, දේශන ශාලාව, ආරක්ෂක කුටිය, නොවාසිකාගාර ගොඩනැගිලි, නිලධාරී නේවාසිකාගාර, විදුලි උත්පාදක යන්ත්‍රාගාරය, පරිගණක ශාලාව, ට්‍රාන්ස්පෝමර කාමරය ආදී වශයෙන් ගොඩනැගිලි පිහිටා ඇති බවද දන්වන ලදි.<br>ඊට අමතරව ස්විස් පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි මෝටර් කාර්මික පාඨමාලාව, කෘෂි යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා පුහුණු පාඨමාලාව, කෘෂි ක්ෂේත්‍ර සහායක පාඨමාලාව ආදී වශයෙන් පාඨමාලා පැවැත්වෙන බවත් මුළු භූමි ප්‍රමාණයම භාවිතයට ගන්නා බවත් දන්වන ලදි.<br>අලුත්වැඩියා කිරීම සඳහා යන්ත්‍රෝපකරණ විශාල ප්‍රමාණයක් පවතින බවද දන්වන ලදි. | | |
| 1.2 | හෙද විද්‍යාලය සඳහා නේවාසික පහසුකම් ලබා ගැනීම හා සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම | හෙද විද්‍යාලයේ නේවාසිකාගාරවල හා අනෙකුත් පහසුකම්වල මද තාවය හේතුවෙන් පැරණි රෝහලේ හෙද නිවාස හෙද විද්‍යාලයේ නොවාසිකාගාර සඳහා ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2023.01.31 දින දිස්ත්‍රික් ලේකම්ගේ අත්සනින් යුතු ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් මේ වන තෙක් ඊට පිළිතුරක් ලැබී නොමැති බවත් වාර්තා විය. | පැරණි රෝහලේ අලුතින් ඉදිකර ඇති ගොඩනැගිලි ඊට යොදාගැනීම සුදුසු බැවින් ඊට අදාල කටයුතු සිදුකරන ලෙසත්, මේ සම්බන්ධයෙන් නැවත සාකච්ඡාවක් සඳහා කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහ රෝහල |
| 1.3 | වනඅලින්ට ගමන් කිරීමට නොහැකි වන පරිදි අධිවේගී මාර්ගයේ ඇති කල්වට් සඳහා එල්ලෙන විදුලි වැට ඉදිකිරීම | කල්වට් අවහිර කිරීම හේතුවෙන් වන අලි දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසීමේ ප්‍රවණතාවයක් තිබෙන බවත්, අධිවේගී මාර්ගයේ විදුලි වැටෙන් එල්ලෙන වැටට විදුලිය ලබා ගැනීමේ දී එල්ලෙන වැටට හානි සිදුවුවහොත් අධිවේගී මාර්ගයේ වැටට ද බලපෑම් ඇති විය හැකි බවත් අධිවේගී මාර්ගයේ විදුලිවැට භාර නිලධාරීන් දන්වා ඇති බව වාර්තා විය. | මේ සඳහා තවදුරටත් දෙපාර්ශවය සමග සාකච්ඡා කර සුදුසු විසඳුමකට එළඹෙන ලෙස දන්වන ලදී. | අධ්‍යක්ෂ ජනරාල් - අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය / සහකාර අධ්‍යක්ෂ (වනජීවී දකුණ) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.4 | සුහුරු ව්‍යාපෘතිය යටතේ ක්‍රියත්මක කරන ලද ව්‍යාපෘති අදාල ආයතනවලට පවරා දීම | පවරා දුන් ව්‍යාපෘති නිසිපරිදි නඩත්තු කරගෙන යනවාද යන්න පිළිබඳව පරීක්ෂා කළ යුතු බවට බළපදෙස් ලබා දුනි. | | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / දිසාවන නිලධාරී / ගොවිජන සේවා සහකාර කොමසාරිස් / පළාත් වාරිමාර්ග ඉංජිනේරු |
| 1.5 | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ බහුඅධියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) ව්‍යාපෘතිය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම | යෝජනා ඉදිරිපත් කර ඇති බවත්, මේ වන තෙක් ප්‍රතිපාදන ලැබී නැති බවත් දන්වන ලදි. | ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙසත් තවද වාරිමාර්ග අමාත්‍යාංශයෙන් මේ සඳහා සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත් දන්වන ලදී. | වාරි මාර්ග අධ්‍යක්ෂ |
| 1.6 | ලෝක බැංකු අධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ඉදිකරන ලද ධාන්‍ය ගබඩා පවරාගැනීම හා සංවර්ධනය කිරීම (වීරවිල, රිදියගම NLDB /මයුරපුර පොල භූමිය) | වීරවිල, මයුරපොල හා රිදියගම ධාන්‍ය ගබඩා 3ක් සාදා අවසන් කර අදාල ආයතන වෙත භාරදී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | මෙම සම්පත් ඵලදායීව භාවිතා විය යුතු අතර ඒ පිළිබඳව පසුවිපරම් කරන ලෙස ද දන්වන ලදී. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම පළාත් පාලන සහකාර කොමසාරිස් කළමණාකරු, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය |
| 1.7 | ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) පිළිබඳව දැනුවත් කිරීම | නව යෝජනා ලබාගෙන ව්‍යාපෘති වාර්තා සමඟ ඉදිරිපත් කර ඇති බවට වාර්තා විය. | ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙසත් තවද වාරිමාර්ග අමාත්‍යාංශයෙන් මේ සඳහා සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත් දන්වන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ / නේවාසික ව්‍යාපාර කලමනාකරු - මහවැලි අධිකාරිය / පළාත් වාරිමාර්ග ඉංජිනේරු |
| 1.8 | දිසාගම වැව් රක්ෂිතය තෘණ වගා කිරීම සඳහා අඟුණකොළපැලැස්ස පශු වෛද්‍ය කාර්යාලය වෙත පවරා ගැනීම | අනවසර කරුවන් ඉවත් කර ඇති නමුත් එක් අනවසරකරුවෙක් පමණක් ඉවත් නොවී සිටින බවත්, ඔහු ඉවත් කරන තෙක් ඉතිරි කොටස්වල මේ වන විට තෘණ වගා කටයුතු සිදුකරමින් පවතින බවත් ඉදිරියේදී එම තෘණ කපා සතුන්ට ලබා දීමට කටයුතු කරන බවත් දන්වන ලදි. | මෙම කාර්යයන්හි ප්‍රගතිය තව දුරටත් සොයා බලන ලෙස දන්වන ලදී. | ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළපැලැස්ස /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ත්ව පාලන) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.9 | හම්බන්තොට මහ රෝහල පිහිටි ඉඩම රෝහල වෙත පවරා දීම | රෝහල ඉදිකිරීම සඳහා ඉඩම මහවැලි අධිකාරිය විසින් රෝහල වෙත පවරා දී ඇති අතර රෝහල ඉදිකිරීමේ දී නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොටසේ ද ඉදිකිරීම් කටයුතු සිදුකිරීම නිසා ඉඩම නිරවුල් කරගැනීමේ ගැටලුවක් මතුවූ බවට කරුණු ඉදිරිපත් වූ අතර එම කටයුතු මේ වන විට නිරාකරණය කරගනිමින් පවතින බවත් ඉදිරි සතියක් ඇතුලත අවසන් කළ හැකි බවත් දන්වන ලදි. | මේ සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබාදුනි. | රෝහල් අධ්‍යක්ෂ - හම්බන්තොට මහරෝහල / නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලිඅධිකාරිය/නියෝජ්‍ය අධ්‍යක්ෂ- නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.10 | වලස්මුල්ල මූලික රෝහලේ අභ්‍යන්තර මාර්ග පද්ධතියේ ඉතිරි වැඩ නිම නොකිරීම හේතුවෙන් මතු වී ඇති ගැටලු | 3km පමණ දිග මෙම මාර්ග පද්ධතියේ 5%ක පමණ කටයුතු ඉතිරි වී ඇති බවත්, එම කටයුතු නිම කර ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති බවත් දන්වන ලදි. | දකුණු පළාත් සභාවේ ප්‍රතිපාදන මඟින් ඉදිරි කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදි. | ආණ්ඩුකාර ලේකම් / දිස්ත්‍රික් ඉංජිනේරු - පළාත් මාර්ග සංවර්ධන අදිකාරිය / වෛද්‍ය අධිකාරී - වලස්මුල්ල මූලික රෝහල |
| **02** | **ජාතික මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 2.1 | අලුත් ගමක් අලුත් රටක් ව්‍යාපෘතිය ප්‍රගතිය ඉදිරිපත් කිරීම | විවිධ ව්‍යාපෘති සඳහා පුහුණුවීම් හා උපකරණ ලබාදුන්න ද ඒවා ඉදිරියට ක්‍රියාත්මක වනවාද යන්න පිළිබඳව අධීක්ෂණය කළ යුතු බවත්, විවිධ වගාවන් සංවර්ධනය කිරීමේ දී ඒවායේ විදේශ වෙළඳපොල, අතුරු නිෂ්පාදන සිදු කිරීමේ හැකියාව, ස්වයං රැකියා උත්පාදනය කළ හැකි අවස්ථාවන්, දේශීය වගාවන්වලදී ඒවායේ ඖෂධීය ගුණය පිළිබඳව දැනුවත් කිරීම ආදී කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි.<br>විවිධ ව්‍යාපෘති අසාර්ථක වීමට හේතු හඳුනාගන්නා ලෙසත් ඒවාට විසඳුම් සෙවිය යුතු බවත් දන්වන ලදි.<br>දිවුල්, කිතුල්, තල්, දං, හිඹටු, රනවරා, රඹුටන්, දූරියන්, මැංගුස්, වැනි වගාවන් ද මුහුදු කූඩැල්ලන්, අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය වැනි කර්මාන්ත ද ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු කරන ලෙස උපදෙස් ලබා දුනි. | | අධ්‍යක්ෂ (ක්‍රසම්පාදන) / සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| | | අනවසර අල්ලාගැනීම් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දන්වා අධිකරණසේවා කොමිෂන් සභාවේ සහාය ලබා ගනිමින් කඩිනම් පියවර ගන්නා ලෙසත්, හෙල බොජුන් හල්වල පෝෂණ බවින් යුත් දේශීය ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමට හැකි වන පරිදි මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලෙසත්, බිම් සවිය වැඩසටහන සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙසත්, අවන්හල්වල ආහාරවල ප්‍රමිතිය සම්බන්ධයෙන් අවධානය යොමු කර අවශ්‍ය පියවර ගන්නා ලෙසත් උපදෙස් ලබා දෙන ලදි. | | අතිරේක දිස්ත්‍රික් ලේකම් - ඉඩම් / අධ්‍යක්ෂ - කෘෂිකර්ම / සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 2.2 | අලුත් ගමක් අලුත් රටක් ව්‍යාපෘතිය ප්‍රගතිය ඉදිරිපත් කිරීම - රෙජිස්ට්‍රාර් අංශය මඟින් උප්පැන්න/විවාහ/ | මේ යටතේ හම්බන්තොට හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී 2023.05.24 වන දින ද, බෙලිඅත්ත, තංගල්ල හා අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී 2023.05.26 දින ද, තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී 2023.05.31 දින ද, කටුවන, වලස්මුල්ල, වීරකැටිය, ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී | | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) / ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | මරණ සහතික නිකුත්කිරීම සඳහා ජංගමසේවා පැවැත්වීම | 2023.06.04 වන දින ද, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023.06.09 වන දිනද උපත්- විවාහ හා මරණ ලේඛන නොමැති පුද්ගලයන් සඳහා එම ලේඛන ලබාදීම සඳහා ජංගමසේවා සංවිධානය කර ඇති බවට තොරතුරු ඉදිරිපත් කරන ලදි. | | |
| **03** | **දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන වැඩසටහන් පිලිබඳ ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 3.1 | 2023 වර්ෂයේ රාජ්‍ය ආයෝජන සැලැස්ම ක්‍රියාත්මක කිරීම කිරීම | විවිධ අමාත්‍යාංශ යටතේ දිස්ත්‍රික්කය පුරා ව්‍යාපෘති 205ක් සඳහා 2023 වර්ෂය වෙනුවෙන් රු.මි. 1525.034ක මුදලක් වෙන් කර ඇති බව දන්වන ලදි.<br>ඊට අමතර වශයෙන් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - PSDG වශයෙන් රු.මි.404.66 මුදලක් ද උපමාන පාදක සංවර්ධන ප්‍රධාන - CBG වශයෙන් 30.59 ක මුදලක් ද වෙන් කර ඇති බව දන්වන ලදි. | මාස 03න් 03ට ප්‍රගති වාර්තා ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 3.2 | දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධ ගැටලු හා ප්‍රගතිය ඉදිරිපත් කිරීම | වී මිලගණන් අඩු වීම නිසා ගොවීන්ට නිෂ්පාදන පිරිවැය හෝ ලබා ගැනීමට අපහසු වී ඇති බවත් මේ හේතුවෙන් බොහෝ ගොවීන් වී ගොවිතැනෙන් ඈත් වී මුං වගාව හා වෙනත් විකල්ප වගාවන් සඳහා යොමු වී ඇති බවත් දන්වන ලද අතර රජය අනුමත වී කිලෝවක මිල රු.100කට හෝ වැඩි කර දෙන ලෙස ඉල්ලීම් කරන ලදි.<br>මෙම වසරේ වී මිල දී ගැනීම සඳහා රු. බිලියන 13ක මුදලක් වැය කර ඇති බවත්, ඊට අමතරව ගොවීන්ට මඩ පොහොර නොමිලයේ ලබා දීම හා වෙනත් සහන ලබා දීම සිදුකර ඇති බවත් දන්වන ලද අතර නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා ගොවියාට සහන ලබා දීම මේ සඳහා විසඳුම වන බැවින් ඊට අදාල කටයුතු සිදුකරමින් පවතින බවට කරුනු ඉදිරිපත් විය. | සහල් අතිරික්ත ගොඩගසා ගෙන සිටීම සුදුසු නොවන බැවින් දැනට පවතින මිලට හෝ විකිණීම සුදුසු බව දන්වන ලද අතර සහල් වලින් කරන වෙනත් නිෂ්පාදන සම්බන්ධයෙන්ද අවධානය යොමු කර කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / ගොවිජන සේවා සංවර්ධන සහකාර කොමසාරිස් |
| | | තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී වසම් 7ක් තෝරාගෙන ඇති අතර නවීන තාක්ෂණය සමඟින් සිදුකරන මෙම වැඩසටහන සඳහා සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදි. ඒවායේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති යෝජනා ලබාගෙන ඇති බවත් ඉන් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතිවල ඉදිරි කටයුතු | නවීන තාක්ෂණය යොදාගනිමින් මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී රජයන් හා ඇමතිවරුන් මාරු වීමේදී වැඩසටහන් සඳහා එය බාධාවක් නොවන අයුරින් සැලසුම් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.<br>බටඅත කෘෂි අලෙවි මධ්‍යස්ථානය, වැලිගත්ත කෘෂි පීඨය වැනි දීර්ඝ කාලීන ව්‍යාපෘතීන් සැලසුම් | අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සිදුකරමින් පවතින බවත්, ඉන් බැහැර ව්‍යාපෘති අදාල අමාත්‍යාංශ වෙත යොමු කිරීමට අපේක්ෂිත බවත් දන්වන ලදි. | කිරීම සුදුසු බවත් පෙන්වා දෙන ලදි. | |
| | | දේශීය පළතුරු හා එළවලු වර්ග මහා පරිමාණ වශයෙන් වගා කර අපනයනය කිරීමේ ව්‍යාපෘතියක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සිදු කරන බවත්, ඒ යටතේ ඇඹුල් කෙසෙල්, අමුමිරිස් වැනි බෝග අපනයනය කිරීම දැනට සාර්ථක අයුරින් ක්‍රියාත්මක වන බවත් මෙම කටයුතු තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා සුදුසු ඉඩම් තිබේනම් ලබාදෙන ලෙස ද දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් අවධානය යොමු කොට අවශ්‍ය සහාය ලබා දීම සුදුසු බව දන්වන ලදි. | සියලුම ආයතන ප්‍රධානීන් |
| 3.3 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීම | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සහාය ලබා ගනිමින් දිස්ත්‍රික්කය පුරා පෝෂණ ඌනතා සහිත දරුවන් හඳුනාගෙන විවිධ වැඩසටහන් පැවැත්වූ බවත්, මාසිකව බර මැනීම මඟින් පෝෂණ අවශ්‍යතා දරුවන් සඳහා ත්‍රිපෝෂ ලබා දීම හා මව්වරුන් වෙනුවෙන් පෝෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කර ඇති බවත් දන්වන ලදි. ඒ අනුව දිස්ත්‍රික්කයේ අවුරුදු 5ට අඩු දරුවන්ගේ පෝෂණ තත්ත්වය හොඳ මට්ටමක පවත්වාගැනීමට හැකි වූ බවට කරුණු ඉදිරිපත් කරන ලදි. | මන්දපෝෂණය පිළිබඳව විවිධ මත පලවන බැවින් නිවැරදි දත්ත නිරන්තරයෙන් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| | | සාපේක්ෂ වශයෙන් ඩෙංගු රෝගීන් වාර්තා වීම හම්බන්තොට වලස්මුල්ල ප්‍රදේශවල වැඩි අගයක් ගන්නා බවත්, එය පසුගිය වර්ෂවලට සාපේක්ෂව අඩු වාර්තා වීමක් බවත් පෙන්වා දෙන ලදි. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මූලික කර ගනිමින් ආරක්ෂක අංශවලද සහයෝගයෙන් පිරිසිදු කිරීමේ වැඩසටහන් හා මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගැනීමේ කටයුතු සිදු කරන ලද බව වාර්තා විය. මේ වන තෙක් මරණ වාර්තා වී නොමැති අතර මදුරුවන් බෝවීම වලක්වා ගැනීම සඳහා සියලුම දෙනා සහයෝගීව කටයුතු කළ යුතු බවපෙන්වා දෙන ලදි. වරායන් ආශ්‍රිතව ඩෙංගු මදුරුවන් බෝ වීමේ වැඩි ප්‍රවනතාවයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>මැයි මස 23 සිට 27 දක්වා ඩෙංගු | සියලුම නිලධාරීන් ඩෙංගු මර්ධන වැඩසටහනට ක්‍රියාකාරීව මැදිහත් වන ලෙසත්, ධීවර වරායන් තුළ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා නිසි පරිදි පිරිසිදු කිරීමේ ක්‍රම අනුගමනය කිරීමට ධීවර වරාය කළමනාකරුවන් දැනුවත් කරන ලෙස දන්වන ලදි. | සියලුම ආයතන ප්‍රධානීන් සහකාර අධ්‍යක්ෂ (ධීවර) සියලුම ධීවර වරායන්වල කළමණාකරුවන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | විශේෂ සතියක් ක්‍රියාත්මක කරන බව ද දන්වන ලදි. | | |
| | | දිස්ත්‍රික්කය තුළ මී උණ රෝගීන් වාර්තාවීමේ වැඩි ප්‍රවනතාවයක් පෙන්නුම් කරන්නේ වලස්මුල්ල, හම්බන්තොට හා සූරියවැව ප්‍රදේශවලින් බවත්, මේ වන විට මරණ 02ක් වාර්තා වී ඇති බවත් දන්වන ලද අතර එම පුද්ගලයින් මඩ ගොවිතැන් කටයුතුවල නිරතවූවන් නොවන බැවින් නිවෙස් ආශ්‍රිත මීයන්ගේ මුත්‍රා ශරීරගතවීමෙන් රෝගය බෝ වීමේ හැකියාවක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. එම නිසා ආරක්ෂිත ආවරණ පැළඳගනිමින් පිරිසිදු කිරීම් කටයුතු වල නිරත වීමේ වැදගත්කම පෙන්වා දෙන ලදි. | සෞඛ්‍ය අංශ විසින් නිකුත් කරන මාර්ගෝපදේශයන් පිළිපදිමින් කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි. | සියලුම ආයතන ප්‍රධානීන් |
| | | දැනට දිස්ත්‍රික්කය තුළ කොවිඩ් රෝගීන් වාර්තා වීමක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | | |
| 3.4 | පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම | කානු පද්ධති පිරිසිදු කිරීම් කටයුතු සුපුරුදු පරිදි සිදුකරමින් පවතින බවත්, කාණු පද්ධති අවහිර වන පරිදි අනවසර ඉදිකිරීම් සිදුකිරීම නිසා ගැටලු පවතින බවත් පෙන්වා දෙන ලදි.<br>බදු අයකිරීම් කටයුතු නිසි පරිදි සිදුවන බව ද දන්වන ලද අතර, සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කිරීමට කටයුතු කරන බවද දන්වන ලදි. පළාත් පාලන ආයතන විසුරුවාහැරීමෙන් පසු ඒවායේ මූල්‍ය අවශ්‍යතා සඳහා පළාත් සභාවෙන්ද අරමුදල් ලබා දී ඇති බවට ද කරුනු ඉදිරිපත් විය. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | පළාත් පාලන සහකාර කොමසාරිස් / පළාත් පාලන ආයතන ලේකම්වරුන් |
| 3.5 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් ගැටලු විසඳීමේ ප්‍රගතිය | අදාල ප්‍රගතිය ඉදිරිපත් කරන ලද අතර, පළාත් ඉඩම් කාර්යාලය සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වන ලදි | විසඳී නැති ගැටලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සොයා බලා පවතින ගැටලු හඳුනාගන්නා ලෙසත්, සෑහීමකට පත් නොවන පුද්ගලයින්ට ආණ්ඩුකාරතුමන්ගේ ද සහාය ලබා ගනිමින් අභියාචනා කමිටුවක් මඟින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / පළාත් ඉඩම් කොමසාරිස් / සියලුම ප්‍රාදේශිය ලේකම්වරු |
| | | ලුණුගම්වෙහෙර බෙරලිහෙල ප්‍රදේශයේ පොහොර නිෂ්පාදනය කරන ව්‍යාපෘතියක් සඳහා ඉඩමක් | මෙවැනි අවස්ථාවලදී ආවරණ අනුමැතිය යටතේ අනුමැතිය ලබා දීමට | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / ප්‍රාදේශීය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ලබා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් වී ඇති බවටත් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන තෙක් ඉඩම ලබා දී නොමැති බවටත් කරුනු ඉදිරිපත් විය. | කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. අනුමැතියෙන් සතියකට පසු කාර්යයන් ඉටු වුවාද යන්න පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ලේකම් - ලුණුගම්වෙහෙර / සහකාර අධ්‍යක්ෂ (පොහොර) |
| | | හම්බන්තොට කැලියපුර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩම් අක්කර 10ක් සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියකට වෙන් කර ඇති අතර ඉන් අක්කර 05ක් ස්ප්‍රීතු කර්මාන්ත ශාලාවක් සඳහා සී/ස මායා ඔස්ට්‍රිලයර් පුද්ගලික සමාගමට ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව වාර්තා වූ අතර, ඒ සඳහා මහවැලි අධිකාරියේ අවසරය අවශ්‍ය බව දන්වන ලදි. මහවැලි අධිකාරිය ඊට එකඟ විය. | මහවැලි අධිකාරියේ අවසරය 2023.05.23 වන විට ලිඛිතව ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි අධිකාරිය නාගරික කොමසාරිස් |
| 3.6 | ආයෝජන ව්‍යාපෘති සඳහා නිදහස් කිරීමට ඇති ඉඩම් හා ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම | අදාල ඉඩම් හඳුනාගෙන අදාල කොන්දේසි සහිතව ප්‍රාදේශිය ලේකම්ගේ කමිටුවක් මඟින් බැහැර කිරීමටත්, ඉඩම් බැහැර කිරීම සඳහා කැබිනට් අනුමැතිය ක් ලබා ගැනීමට කටයුතු කර ඇති බවට වාර්තා විය. | | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / සියලුම ප්‍රාදේශිය ලේකම්වරු |
| 3.7 | නව රැකියා උත්පාදනය සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම | විවිධ නිෂ්පාදන වර්ග සඳහා පුහුණුවීම් සිදුකරන බවට තොරතුරු ඉදිරිපත් විය. | කුඩා ව්‍යාපාර අංශය, මානව සම්පත් සංවර්ධන අංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය හා විදාතා නිලධාරී යන නිලධාරීන් නව රැකියා උත්පාදනය සම්බන්ධ වාර්තාවක් ලබාදිය යුතු බවට දන්වන ලදි. | සහකාර අධ්‍යක්ෂ - කුඩා ව්‍යාපාර / සහකාර අධ්‍යක්ෂ - කාර්මික සංවර්ධන මණ්ඩලය / මානව සම්පත් සංවර්ධන නිලධාරී / විදාතා සංවර්ධන නිලධාරී |
| 3.8 | ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ රැස්වීම්වලදී පැන නගින ගැටලු පිළිබඳව දැනුවත් කිරීම | ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා ප්‍රමාණවත් ලිපිද්‍රව්‍ය නොමැති වීම, කාර්යාල දීමනා ලබා ගැනීම ආදී ගැටලු පවතින බවට තොරතුරු ඉදිරිපත් විය.<br>පොදු රාජකාරි පැවරීමේ දී ඇතැම්විට වෘත්තීය සමිති මැදිහත් වීමෙන් ඊට සම්බන්ධ නොවන බවටද කරුණු ඉදිරිපත් විය. | ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන ලදි. | සියලුම ප්‍රාදේශිය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **04** | **දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය සංවර්ධනයට අදාලව ආයතන මඟින් යොමු කර ඇති යෝජනා** | | | |
| 4.1 | කළමැටිය මාදැල් රැකියාවේ නිරතවූවන් 28 දෙනා වෙනුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරයක් කරගැනීම සඳහා හම්බන්තොට නගරයෙන් සුදුසු ඉඩමක් හඳුනාගැනීම | කළමැටිය ධීවර වරාය ඉදිකිරීමේ දී මාදැල් රැකියාවේ නිරත වූ අයගේ රැකියාව අහිමි වීම සම්බන්ධයෙන් වන්දි මුදල් ලබා දුන්න ද එය ප්‍රමාණවත් නොවන බැවින් රැකියාව අහිමි වූ බවට පැවසෙන ධීවර කාර්මිකයින් 28 දෙනා වෙනුවෙන් ඔවුන්ගේ ව්‍යාපාරයක් කර ගැනීම සඳහා හම්බන්තොට නගරයෙන් වෙළඳසැල් ඉදිකර ගැනීමට සුදුසු ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවට වාර්තා විය.<br>මේ සඳහා සුදුසු ඉඩම් හඳුනා ගත යුතු බවට ද කරුණු ඉදිරිපත් විය. | වෙළඳ කුටි සඳහා ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් ඇති හැකියාව සොයා බලා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් / සහකාර අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 4.2 | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය පවත්වාගෙන යනු ලබන රන්මිණිතැන්න ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා දීම | තිස්සමහාරාම ජුල්පල්ලම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම ආයතනය සඳහා එම ඉඩමේ අක්කර 4ක පමණ ප්‍රමාණය ගාස්තු අයකිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බවට කරුනු දක්වන ලදි. | එම ඉඩම අදාල ආයතනය වෙත ලබා නොදෙන ලෙසත්, ව්‍යාපෘති වාර්තාවක් නොමැතිව ආයතනවලට ඉඩම් ලබා නොදෙන ලෙසත්, එසේ ලබා දීමේ දී නිශ්චිත කාලයක් තුළ අදාල කටයුතු සිදුකළ යුතු බවටත් කොන්දේසියක් ඇතුලත් කරන ලෙසත් උපදෙස් ලබා දුන් අතර, ප්‍රයෝජනයට නොගන්නා ඉඩම් පවතීනම් ඒවා වගාවන් සඳහා ලබා දීම සුදුසු බවත් පෙන්වා දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය |
| 4.3 | මැදමුලන පල්ලෙමුලන පැඟිරිවත්ත නව ගම්මානය සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් පානීය ජලය ලබා ගැනීම | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ මෙවැනි කටයුතු සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් මුදල් යෙදවීමට ප්‍රතිපාදන නොමැති බවත්, එසේ යෙදවීම විගණන අධිභාරයට ලක්වීමට හේතුවක් වන බැවින් සහනදායී පදනමක් යටතේ ඉල්ලුම්කරුවන්ට ජලය ලබාදීම සුදුසු බවත් දන්වන ලදි. ස්ථිර පදනමක් යටතේ ජලය ලබා දීමට පවතින ධාරිතා මට්ටම ප්‍රමාණවත් නොවන බවත් මුර ක්‍රමයක් යටතේ ජලය ලබා දීමට හැකි බවට කරුණු ඉදිරිපත් විය. | මුර ක්‍රමය යටතේ හෝ අදාල ප්‍රදේශයේ ජනතාවට ජලය ලබා දීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජලදම්පාදන මණ්ඩලය / පළාත් පාලන සහකාර කොමසාරිස් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.4 | බඳගිරිය ගොවි සෙවන පරිශ්‍රයෙහි ඇති, වනජීවී ප්‍රජා සංවර්ධන සමිතිය මඟින් ඉදිකරන ලද වී ගබඩාව පොහොර ගබඩා කිරීම සඳහා ලබා ගැනීම | බඳගිරිය ව්‍යාපාරය යටතේ අක්කර 2191ක පමණ වී වගාව සිදු කරන බවත්, ඒ සඳහා අවශය පොහොර පල්ලෙමලල ගොවිජනසේවා මධ්‍යස්ථානයෙන් ලබාගැනීමේ දී ප්‍රවාහනය සඳහා අධික මුදලක් වැය වන බවත්, එකවර පොහොර ලබාගෙන ගබඩා කර ගැනීමට ස්ථානයක් නොමැති කම හේතුවෙන් මෙම ගැටලුවලට මුහුණ දෙන බවත් දන්වන ලදි. මේ සඳහා විසඳුමක් ලෙස ගොවිසෙවන පරිශ්‍රයේ ඉදිකර පවතින ප්‍රජා මූල සමිතියට පවරා ඇති දැනට ප්‍රයෝජනයට නොගන්නා වී ගබඩාව පොහොර ගබඩා කර ගැනීම සඳහා ලබාදීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය. | ප්‍රාදේශීය ලේකම් වෙත පවරා පොහොර ගබඩාව සඳහා ලබාදීමට සම්බන්ධීකරණ කමිටු එකඟතාවය ලබාදෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / සහකාර අධ්‍යක්ෂ (වනජීවී දකුණ) / සහකාර අධ්‍යක්ෂ (පොහොර) |
| 4.5 | අඟුණකොළපැලැස්ස දිසා රෝහලේ ආරක්ෂිත වැට ඉදිකිරීම සම්බන්ධයෙන් ඇති ගැටලු | මෙම රෝහලේ මෘත ශරීරාගාරය පිහිටි ඉඩම් කොටසේ එක් පැත්තකින් අනවසර පදිංචිකරුවන් විසින් ස්ථාවර ගොඩනැගිලි ඉදිකර ව්‍යාපාරික ස්ථාන පවත්වාගෙන යන බවත්, එම ගොඩනැගිලි ඉදිකර තිබුණු මායිම් සඳහා ආරක්ෂිත වැටක් නොතිබීම හේතුවෙන් රෝහල් භූමියේ කොටස් තවදුරටත් මෙම අනවසර පදිංචිකරුවන් විසින් අත්පත්කර ගැනීමේ අවධානමට ලක්ව ඇති බවත් දන්වන ලදි. | මේ සම්බන්ධයෙන් සොයා බලා කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස දන්වන ලදි. තව ද නාගරික සංවර්ධන අධිකාරියේ සැලැස්මට අනුව සතිපොල පිහිටි ප්‍රදේශයේ ඇලවිසැල් ඉදිකිරීමට ඔවුන්ට අවස්ථාව ලබාදිය හැකිදැයි සොයා බලන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළපැලැස්ස / දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නේවාසික ව්‍යාපාර කළමණාකරු, මහවැලි අධිකාරිය |
| 4.6 | රෝහල්වල පවතින සේවක පුරප්පාඩු පුරවා ගැනීම සඳහා බහුකාර්ය සේවකයින් බඳවාගැනීම | හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා සේවකයින් 115ක් ලබාදුන්නද ඉන් ඇතැම් සේවකයන් දිස්ත්‍රික්කයෙන් පිට පදිංචිකරුවන් වීම නිසා ඔවුන් ස්ථානමාරුවීම් ලබාගෙන ගොස් ඇති බවත්, තවත් සේවකයන් විවාහක කාන්තාවන් වීම නිසා පදිංචි ස්ථානයට දුරින් සේවා ස්ථාන ලබා දීම අකාර්යක්ෂම බවත් දන්වන ලදි.<br>740ක ප්‍රමාණයක් පළාත් සභාවට බඳවාගැනීමට හැකියාව පවතින බවත් ඒ සඳහා බහුකාර්ය දෙපාර්තමේන්තුවෙන් අදාල ලේඛනය ලබාදිය යුතු බවත් දන්වන ලදි. | දෙපාර්තමේන්තු ප්‍රධානීන් තමා යටතේ ඇති පුරප්පාඩු වලින් බහුකාර්ය සේවකයින් අනුයුක්ත කළ හැකි පුරප්පාඩු පිලිබඳව බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන ලෙස දන්වන ලදි. | සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සහකාර අධ්‍යක්ෂ - බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.7 | දෙබරවැව ජාතික පාසලට 6 ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරීමේ දී මුහුණපෑමට සිදුවන ගැටලුවලට විසඳුම් ලබා ගැනීම | යඨාලතිස්ස පාසලේ ළමුන් ලකුණු නිර්නායකයක් නොමැතිව ඇතුලත්කර ගන්නා නිසා 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත්වන දරුවන්ට දෙබරවැව ජාතික පාසලට ඇතුලත්වීමට අවස්ථාව නොලැබෙන බවට කරුනු ඉදිරිපත් විය.<br>2012 වර්ෂයේ සිට ද්විතීක පාසල් වැඩසටහනට අනුව පාසල් ව්‍යුහ කමිටු අනුමැතිය යටතේ වෙනත් පාසල්වල දරුවන් ඇතුලත් කරගෙන ඇති බවත්, වර්ථමානයේ ශිෂ්‍යත්වය සමත්වන දරුවන් ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් එම දරුවන්ට අවස්ථාව අහිමි වී ඇති බවත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත් දන්වන ලදි. | 2012 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති තීරණය මත කටයුතු කිරීම ප්‍රායෝගික නොවන බවත් ශිෂ්‍යත්වය සමත් දරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බවටත් විකල්ප ලෙස දෙබරවැව ජාතික පාසල ආසන්නයෙන් සංවර්ධනය කළ හැකි පාසල් 03ක තොරතුරු දකුණු පළාත් සභාවට ලබා දෙන ලෙසත් දන්වන ලදී. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 4.8 | තිස්සමහාරාම සහකාර පොලිස් අධිකාරී කාර්යාලය පවත්වාගෙන යාම සඳහා තාවකාලිකව ලබා දී ඇති ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම නැවත පවරා ගැනීම | තංගල්ල පොලිස් අධිකාරී තුමන්ගේ ඉල්ලීම පරිදි සහකාර පොලිස් අධිකාරී කාර්යාලය පිහිටුවීමේදී තාවකාලිකව ලබා දී තිබූ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සේවක නිල නිවස හා වීරවිල ගම්සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට භාරදිය යුතු බවටත් එය දිර්ඝ කාලයක් තිස්සේ ප්‍රාදේශීය සභාව විසින් භුක්තිවිඳින ලද ඉඩමක් වන බැවින් එය නැවත ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලීම් ඉදිරිපත් විය. | එම ඉඩම හා ගොඩනැගිලි ප්‍රාදේශීය සභාවට නැවත ලබාදීම සුදුසු බවට තීරණය වූ අතර, පොලිස් අධිකාරී කාර්යාලයට අවශ්‍ය වෙනත් ඉඩමක් ලබාදීම සුදුසු බවට ද තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය / සහකාර පොලිස් අධිකාරී - තංගල්ල / ලේකම් - තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව |
| 4.9 | සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු ඉඩම් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම | සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති මහවැලි අධිකාරියට අයත් ක්‍රීඩාපිටි, සුසාන භූමි, ප්‍රජා ශාලා, ළමා උද්‍යාන හා පොදු බිම් ප්‍රදේශ ප්‍රාදේශීය සභාවට පවරා දෙන්නේ නම් ඒවා නඩත්තු කිරීම හා එම භූමි වටා වැටවල් ගසා අනවසරකරුවන් අල්ලා ගැනීම වැළැක්වීමට පියවර ගතහැකි බව දන්වන ලදි. | මායිම් ලකුණු කර කොන්දේසි සහිතව භාරදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - මහවැලි අධිකාරිය / ලේකම් - සූරියවැව ප්‍රාදේශීය සභාව |
| 4.10 | සුනාමි ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නිවාසවල හිමිකම් සම්බන්ධ ගැටලු | සුනාමි ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නිවාස එවකට සුනාමියෙන් අවතැන් නොවූවන් වෙතද ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් වූ අතර, එම නිවාස අයත් ඉඩම් නියමානුකූල කිරීම සඳහා ආදායම් බාණ්ඩ පදනම් කර ගනිමින් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ හෝ රජයේ ඉඩම් ආඥාපනත යටතේ | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඉඩම් කච්චේරි පැවැත්වීම සුදුසු බැවින් ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. | | |
| **05** | **දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතිය ලබාගත යුතු යෝජනා** | | | |
| 5.1 | ප්‍රජා ජල යෝජනා ක්‍රම 10ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට පවරා දීම. | දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව පවත්වා අනුමැතිය ලබාගන්නා තෙක් ආවරණ අනුමැතිය ලබාදී ඇති බුද්ධියාගම බටහිර, අම්බලන්තොට රොටේ, සියඹලාමුරය, පුවක්ගස්ආර, බුලත්වැල්ආර, ගල්ලිඳමුල්ල, කරමැටිය, බින්තැන්න, රනසිංහගොඩ, බෝවල උතුර / බටහිර, යන ප්‍රජාජල යෝජනා ක්‍රම සඳහා කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි. | ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලදි. | ප්‍රාදේශීය කළමනාකරු - ජලසම්පාදන මණ්ඩලය / ස්ථාන භාර නිලධාරී - ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 5.2 | සූරියවැව ඉදිකිරීමට යෝජිත කර්මාන්ත පුරය සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | සූරියවැව, සූරවිරුගම ග්‍රාම නිලධාරී වසමේ වැලිආර ගම් ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත කර්මාන්ත පුරය අයත් අක්කර 20ක් පමණ වන ඉඩම කර්මාන්ත අමාත්‍යාංශය වෙත පවරා දීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන ලදි. | ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර ඉදිරි කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - සූරියවැව |
| **06** | **පසුව ලැබුණු ලිපි** | | | |
| 6.1 | අම්බලන්තොට නව නගර සැලැස්ම පිළිබඳව දැනුවත් කිරීම | දැනට අම්බලන්තොට පොල පවත්වන ස්ථානය අසල පිහිටි ඉඩම කොන්දේසි සහිතව සංවර්ධනයට යොදා ගැනීම සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ද සහභාගීත්වයෙන් 2023.05.18 දින පැවති ක්ෂේත්‍ර චාරිකාවේ දී තීරණය වූ අතර එහි ගොවිජනසේවා මධ්‍යස්ථානය සමග බීජ අලෙවි සැලක්, හෙල බොජුන්හලක් හා පොහොර අලෙවිසැලක් ඉදි කිරීමේ එකඟතාවය මත නගර සංවර්ධනය සඳහා එම ඉඩම ලබාදීමට එකඟතාවය පලවිය. | මෙ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට / සහකාර අධ්‍යක්ෂ බීජ පර්යේෂණ ආයතනය, අම්බලන්තොට/ අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / සහකාර අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / ලේකම්- අම්බලන්තොට ප්‍රාදේශීය සභාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 6.2 | අම්බලන්තොට වී පර්යේෂණ ආයතනය අසල ඇති අනවසර ඉදිකිරීම් සම්බන්ධ ගැටලුව | විවිධ වී ප්‍රභේද අත්හදා බලමින් පර්යේෂණ සිදුකරන මෙම ස්ථානයේ අනවසර වෙළඳසැල් හිමියන් විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම හා කානු පද්ධතිය අවහිර වීම හේතුවෙන් ගැටලු මතු වී ඇති බවට කරුනු ඉදිරිපත් වූ අතර එම ඉදිකිරීම් ඉවත් කිරීම හා නතර කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. | අනවසර වෙළඳසැල් ඉවත් කිරීමත් ඔවුන්ට වෙනත් සුදුසු ස්ථානයක ජංගම අලෙවි රථ යොදාගෙන වෙළඳාම් කිරීමට පහසුකම් සැලසීමත් අදාල අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අදාල අංශවල සහාය ලබා දෙන ලෙසත්, වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත නිරවුල් කර ගැනීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රධාන ඉංජිනේරු- මාර්ග සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ - වාරිමාර්ග / ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල / සහකාර අධ්‍යක්ෂ - වී පර්යේෂණ ආයතනය |
| 6.3 | කිරින්ද පන්සල හා මුස්ලිම් පල්ලියට යාබද ඉඩම්වල අයිතිය සම්බන්ධ ගැටළුව | කිරින්ද විහාරස්ථානයට බලපත්‍රයක් මත අයිතිය හිමිව ඇතැයි පැවසෙන භූමිය එළිපෙහෙළි කිරීමට යාමේ දී එම ප්‍රදේශය හරහා කෝලියස් නිවාස සංකීර්ණය අසලින් අවහිර වන බව පවසමින් ගම්වාසී පිරිසක් හා පන්සල අතර ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වෙමින් පවතින බවත් අද දින නිලධාරීන් සහ අදාල අනෙකුත් පාර්ශව සමග ස්ථානීය පරීක්ෂාව සිදු කර අදාල ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බවත් දැනුම් දෙන ලදී. | ගැටුම්කාරී වාතාවරණයක් ඇති නොවන පරිදි එම ගැටලුව නිරාකරණය කර වාර්තා කරන ලෙස දන්වන ලදි. | ප්‍රාදේශීය ලේකම් - තිස්සමහාරාමය |

න්‍යාය පත්‍රයේ සඳහන් සියලු කරුණු සාකච්ඡා කිරීමට කාල වේලාව ප්‍රමාණවත් නොවන බැවින් රැස්වීමේ කටයුතු අවසන් කරන බව දන්වන ලද අතර, ප්‍රාදේශීය මට්ටමින් විසඳාගත හැකි ගැටලු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට ඉදිරිපත් කරන ලෙසත්, විශේෂ ගැටලු පවතීනම් ඒවා පමණක් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ න්‍යායපත්‍රයට ඇතුලත් කරන ලෙසත්, උපදෙස් ලබා දෙන ලදි. අනතුරුව, රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් දේශපාලන අධිකාරිය වෙත හා කමිටුවේ සියලුම සාමාජිකයන් වෙත ස්තූතිය පලකරමින් ප.ව 01.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

එච්.පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

2023 මැයි මස 29 දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දීය.